විභාග අංකය:

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2016

ජනවාරි - 2022

**BMGT E 1025 - ව්‍යාපාර ගණකාධිකරණය**

කාලය: පැය 03 යි

උපදෙස්

i. A කොටසේ සහ B කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. ප්‍රශ්න සංඛ්‍යාව:

A කොටස - ප්‍රශ්න 20 යි

B කොටස - ප්‍රශ්න 03 යි

iii. A කොටසට අදාල පිළිතුරු අනිවාර්යයෙන්ම ප්‍රශ්න පත්‍රයෙහිම සඳහන් කළ යුතු අතර, එය පිළිතුරු පොතෙහි ඇමිණිය යුතුයි.

iv. ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමෙන් වළකින ලෙස ඔබට තරයේ අවවාද කරනු ලැබේ.

v. ගණක යන්ත්‍ර භාවිතා කල හැකිය.

A කොටස

**මෙම කොටසේ ප්‍රශ්න අංක 1 - 15 දක්වා පිළිතුරු සැපයීමේදී නිවැරදි පිළිතුර යටින් පැහැදිලිව ඉරක් අඳින්න.**

01. පහත සඳහන් ඒවායින් ව්‍යාපාර ගිණුම්කරණයේ අරමුණක් නොවන්නේ කුමක්ද?

අ) ආර්ථික සම්පත් පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

ආ) මූල්‍ය තොරතුරු පමණක් සැපයීම.

ඇ) නීතිමය අවශ්‍යතා සපුරාලීම.

ඇ) ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කිරීම.

02. සමාගමක ආයතනික වෙබ් අඩවිය යනු ..........................................

අ) ක්‍රියාකාරී වත්කමකි

ආ) ජංගම වත්කමකි

ඇ) අස්පෘශ්‍ය වත්කමකි

ඈ) ව්‍යාජ වත්කමකි

03. මෝටර් රථ වෙළඳාම් කරන තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරුවෙකු ඔහුගේ පුද්ගලික භාවිතය සඳහා ඔහුගේ ව්‍යාපාරයෙන් මෝටර් රථයක් ලබා ගනී. ඉහත ගනුදෙනුවට අදාළව පහත සඳහන් ඒවායින් සත්‍ය වන්නේ කුමක්ද?

අ) මෝටර් රථය විකිණීම සඳහා තවදුරටත් ව්‍යාපාරය තුළ නොමැති නිසා එය ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනාගත යුතුය.

ආ) අයිතිකරු දැන් එම මෝටර් රථය භාවිතා කරන බැවින් හිමිකම් වැඩි වීමක් සහ ව්‍යාපාර වත්කම් අඩු වීමක් සිදුවේ.

ඇ) හිමිකරු ව්‍යාපාරයෙන් සම්පත් පිටතට ගෙන ඇති බැවින් ව්‍යාපාරයේ වත්කම් සහ හිමිකම් යන දෙකම අඩු විය යුතුය.

ඈ) මෝටර් රථය ආරක්ෂිත බැවින් සහ එය අයිතිකරු සන්තකයේ ඇති බැවින් කිසිදු ගැලපීමක් අවශ්‍ය නොවේ.

04. සමාගමක ගිණුම් කටයුතු අවසන් කිරීමෙන් පසුව, එහි ආරම්භක තොගය රු. 100,000 කින් අධිතක්සේරු වී ඇති බවත් අවසන් තොගය රු. 200,000 කින් අවතක්සේරු වී ඇති බවත් අනාවරණය වුනි. එවිට සැබෑ දළ ලාභය;

අ) වාර්තා කරන ලද දළ ලාභයට වඩා රු. 300,000 කින් අගය වැඩිය.

ආ) වාර්තා කරන ලද දළ ලාභයට වඩා රු. 300,000 කින් අගය අඩුය.

ඇ) වාර්තා කරන ලද දළ ලාභයට වඩා රු. 100,000 කින් අගය වැඩිය.

ඈ) වාර්තා කරන ලද දළ ලාභයට වඩා රු. 100,000 කින් අගය අඩුය.

05. පහත සඳහන් දේවලින් තෝලන අනුපාතයක් වන්නේ?

අ) ජංගම අනුපාතය.

ආ) ණයගැති පිරිවැටුම් අනුපාතය.

ඇ) කොටසක ඉපයුම.

ඈ) පොලී ආවරණ අනුපාතය.

06. හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමේදී, බැංකු අයිරාව මාරු කරනු ලබන්නේ

අ) බැංකු ගිණුමටය.

ආ) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමටය.

ඇ) උපලබ්ධි ගිණුමටය.

ඈ) මුදල් ගිණුමටය.

07. සමාගමක් රු. 32,000 ක් වූ යන්ත්‍රයක් මිලට ගන්නා ලදී. හීනවන ශේෂ ක්‍රමය භාවිතා කරමින්, 25% ක ක්ෂය අනුපාතයකින් එය ක්ෂය කළ යුතුය. වසර දෙකකට පසු එහි පොත් වල අගය කොපමණ වේද?

අ) රු. 16,000

ආ) රු. 24,000

ඇ) රු. 22,000

ඈ) රු. 18,000

08. සීතා සහ ගීතා 3:2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගන්නා ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. ලාභයෙන් ¼ කොටසක් සඳහා ඔවුන් නීතා හවුල්කරුවෙකු ලෙස බඳවා ගනියි. නීතාගේ ලාභ කොටස සඳහා සීතා සහ ගීතා සමානව දායකවේ. හවුල්කරුවන්ගේ නව ලාභ බෙදාගැනීමේ අනුපාතය ගණනය කරන්න.

අ) 4:3:1

ආ) 19:12:10

ඇ) 3:2:1

ඈ) 19:11:10

09. X, Y, සහ Z ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. 2020 තුළ X විසින් සෑම මසකම ආරම්භයේදී රු. 5,000 ක් බැගින් ගැනිලි සිදු කර ඇත. හවුල්කරු සඳහා වසරකට 12% බැගින් වසරක් සඳහා X හවුල්කරුගේ ගැනිලි පොලී ගණනය කරන්න.

අ) රු. 3,000

ආ) රු. 3,600

ඇ) රු. 3,900

ඈ) රු. 3,300

10. 2020 ජනවාරි 01 වැනි දින සියොන් ලංකා (පුද්ගලික) සමාගම විදේශ රටකින් රු. 370,000 කට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි. සමාගමට 10% ක වෙළඳ වට්ටමක් ලැබුණි. නැව් ගාස්තු රු. 50,000 ක් වන අතර සමාගමට රු. 17,000 ක ආපසු අයකරගත නොහැකි ගැනුම් බද්දක් ගෙවීමට සිදුවිය. තවද, යන්ත්‍රය සඳහා රු. 20,000 ක රක්ෂණ වියදම් දැරීමටද සමාගමට සිදු විය. කෙසේ වෙතත් සමාගමට යන්ත්‍රය සඳහා රු. 10,000 ක් රජයේ සහනාධාර ලෙස ලැබුණි.

යන්ත්‍රයේ ගැනුම් පිරිවැය කොපමණ වේද?

අ) රු. 400,000

ආ) රු. 410,000

ඇ) රු. 420,000

ඈ) රු. 430,000

11. 2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමක ලාභ හා අලාභ ගිණුමේ රු. 530,000 ක ශුද්ධ ලාභයක් පෙන්වයි. 2020 දෙසැම්බර් 01 වැනි දින රු. 200,000 ක් ගෙවා සමාගම යන්ත්‍රයක් මිලදී ගෙන ඇති අතර මෙය යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ පිරිවැයක්සේ වැරදි ලෙස ගිණුම්ගත කර ඇත. සමාගම මෙම යන්ත්‍රය පිරිවැය මත වාර්ෂිකව 20% ක් ක්ෂය කරයි. ඉහත කරුණු ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය විය යුත්තේ,

අ) රු. 716,667

ආ) රු. 690,000

ඇ) රු. 730,000

ඈ) රු. 516,667

12. සමාගමක් රු. 5,000 ක් වටිනා භාණ්ඩ තොගයක් 2021 මාර්තු 05 වැනි දින සහ රු. 10,000 ක් වටිනා භාණ්ඩ තොගයක් 2021 මාර්තු 28 වැනි දින විකුණන ලදි. සමාගමට පළමු භාණ්ඩ තොගය සඳහා ගෙවීම ලැබුණේ 2021 මාර්තු 25 වැනි දින වන අතර දෙවන භාණ්ඩ තොගය සඳහා ගෙවීම ලැබුණේ 2021 අප්‍රේල් 7 වැනි දිනය. සමාගම 2021 මාර්තු 31 වැනි දින මූල්‍ය ප්‍රකාශනය සකස් කළේය. මූල්‍ය ප්‍රකාශනයේ මුළු විකිණුම් අගය කොපමණද?

අ) රු. 10,000

ආ) රු. 12,000

ඇ) රු. 15,000

ඈ) රු. 5,000

13. සමාගමේ ණය සහ අනෙකුත් වගකීම් සඳහා සියලුම හිමිකරුවන් නීත්‍යානුකූලව වගකිව යුතු ව්‍යාපාරයක් හඳුන්වනු ලබන්නේ:

අ) සමුපකාර සමිතියක් ලෙසය.

ආ) සීමා රහිත සමාගමක් ලෙසය.

ඇ) සීමා සහිත සමාගමක් ලෙසය.

ඈ) ඇපයෙන් සීමිත සමාගමක් ලෙසය.

14. ප්‍රාථමික පිරිවැය යනු කුමක්ද?

අ) සියලුම වඩාත්ම වැදගත් වියදම්වල මුළු පිරිවැයවල එකතුවයි.

ආ) සියලුම සෘජු ද්‍රව්‍ය පිරිවැය සහ සියලුම සෘජු ශ්‍රම පිරිවැයවල එකතුවයි.

ඇ) සියලුම සෘජු පිරිවැය සහ සියලුම නිෂ්පාදන පොදුකාර්යය පිරිවැයවල එකතුවයි.

ඈ) සියලුම සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ අනෙකුත් සියලුම සෘජු වියදම්වල එකතුවයි.

15. සමාගමක විකුණුම් ඒකක 2,600 කි. ආරම්භක තොගය ඒකක 1,400 ක් පවතින අතර අවසන් තොගය ඒකක 1,800 ක්වේ යයි අපේක්ෂා කරයි. විකුණුම් ප්‍රමාණය සපුරාලීමට අවශ්‍ය නිෂ්පාදන ඒකක ප්‍රමාණය කොපමණද?

අ) ඒකක 2,437

ආ) ඒකක 3,000

ඇ) ඒකක 2,600

ඈ) ඒකක 2,200

(ලකුණු 02 x 15 = ලකුණු 30)

ප්‍රශ්න අංක 16 - 20 දක්වා, පිළිතුරු සපයා දී ඇති හිස්තැනෙහි ලියන්න.

16. "පොත් තැබීම" සහ "ගිණුම්කරණය" අතර වෙනස කුමක්ද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

17. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ සංකල්ප හතර (04) ක් ලැයිස්තුගත කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

18. කෙටිකාලීන මුදල් හිඟයක් සඳහා සුදුසු කළමනාකරණ ක්‍රියාමාර්ග දෙකක් (02) ක් සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

19. ව්‍යාපාරයක අවසන් බඩු තොගයේ පිරිවැය රු. 1,875,200 වටිනාකමින් යුක්ත වේ. මෙම බඩු තොගය තුළ ප්‍රවාහනයේදී හානි වූ පිරිවැය රු. 45,500 ක් වූ බඩු තොගයක්ද ඇතුලත්වේ. මෙම හානියට පත් බඩු තොගය රු. 7,300 ක අලුත්වැඩියා පිරිවැයක් දැරීමෙන් පසු රු. 31,150 කට අලෙවි කළ හැකි බවට ඇස්තමේන්තු කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කලයුතු නිවැරදි අවසන් බඩු තොගයේ වටිනාකම කොපමණද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

20. අත්‍රි සහ ප්‍රීති පිළිවෙලින් රු. 500,000 ක ප්‍රාග්ධනයක් සහ රු. 300,000 ක ප්‍රාග්ධනයක් සහිතව හවුල් ඔප්පුවක් නොමැති හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. හවුල් ව්‍යාපාරයේ වැඩිපුර ආයෝජනය කර ඇත්තේ තමන් බැවින් ලාභ, ප්‍රාග්ධන අනුපාතයට බෙදා ගැනීමට අවශ්‍ය බව අත්‍රි පවසයි. අත්‍රිගේ ප්‍රකාශය වලංගු වන්නේද? ඔබගේ පිළිතුරට අදාල ප්‍රධානතම හේතුව දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 02 X 05 = ලකුණු 10)

**(A කොටස - මුළු ලකුණු 40)**

## B කොටස

ප්‍රශ්න අංක 01

2021 මාර්තු 31 දින ස්කයිලයිට් (පෞද්) සමාගමෙහි ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර (රු. 000) | බැර (රු. 000) |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (සම්පූර්ණයෙන් ගෙවන ලද කොටස් රු. 100 බැගින්) | | 500,000 |
| රඳවාගත් ඉපැයුම් | | 77,060 |
| ආයෝජන | 450,000 | |
| යන්ත්‍ර පිරිවැය | 150,000 | |
| ගෘහභාණ්ඩ පිරිවැය | 46,000 | |
| 01. 04. 2020 දිනට සමුච්චිත ක්ෂයවීම් | | |
| - යන්ත්‍ර | | 30,000 |
| - ගෘහභාණ්ඩ | | 11,040 |
| වෙළඳ ණයගැති | 52,000 | |
| වෙළඳ ණයහිමි | | 42,000 |
| අතැති මුදල් | 2,400 | |
| පොලී වියදම් | 3,500 | |
| ගැනුම් | 145,000 | |
| විකුණුම් | | 298,250 |
| ආපසු එවුම් | 2,600 | |
| වැටුප් | 8,420 | |
| 01. 04. 2020 දිනට තොගය | 11,400 | |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | 3,600 | |
| රක්ෂණ වාරිකය | 2,400 | |
| බැංකු මුදල් | 6,200 | |
| වේතන | 23,600 | |
| පොදු වියදම් | 13,280 | |
| ගෙන ඒමේ වියදම් | 2,050 | |
| ගෙන යාමේ වියදම් | 1,620 | |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 6,430 | |
| අධ්‍යක්ෂ ගාස්තු | 18,000 | |

| | | |
|---|---|---|
| කුලී | 3,600 | |
| 01. 04. 2020 දිනට ආදායම් බදු වෙන්කිරීම් | | 12,500 |
| ගෙවූ ආදායම් බදු | 18,750 | |
| | **970,850** | **970,850** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1. 2021 මාර්තු 31 දිනට පැවති තොගයේ වටිනාකම රු. 35,000,000 ක් විය.
2. වෙළඳ ණය ගැතියන්ගෙන් රු. 5,000,000 ක් බොල් ණය ලෙස කපා හැරීමටත්, 2021 මාර්තු 31 දිනට ඉතිරි වෙළඳ ණයගැති ශේෂයෙන් 10% ක් අඩමාන ණය සඳහා පොදු ප්‍රතිපාදනයක් කිරීමටත් කළමනාකාරිත්වය තීරණය කරන ලදී.
3. ගෘහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ පිළිවෙලින් 10% සහ 12% යන ප්‍රතිශත වලට ඒවායේ මුල් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
4. කොමිස් අදායම ලෙස රු. 3,600,000 ක් උපයා ඇති නමුත් ගිණුම් වර්ෂය අවසන් වන තුරු එය ලැබී නොමැත.
5. 2019/20 වර්ෂය සඳහා මුළු අදායම් බදු වගකීම රු.13,450,000 ක් වූ අතර සම්පූර්ණ මුදලම වර්ෂය තුලදී ගෙවන ලදී. 2020/21 වර්ෂය සඳහා මුලු ආදායම් බදු වගකීම රු 11,760,000 ක් ලෙස ඇස්තමේන්තුකර ඇත.
6. විගණක ගාස්තු රු. 500,000 ක් ගෙවා ඇති අතර එය පොදු වියදම් තුල ඇතුළත් වේ.
7. මාසික රක්ෂණ වාරිකය රු. 250,000 ක් වන අතර වර්ෂය තුලදී සමාගම විසින් රු. 2,400,000 ක් රක්ෂණ වියදම් ලෙස ගෙවා ඇත.
8. සමාගමට එහි මුළු ආයෝජන සඳහා වාර්ෂිකව 10% ක පොලියක් ලැබෙන අතර ගිණුම් වර්ෂය අවසන් වන තෙක් මෙම පොලිය ලැබී නොමැත.
9. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2021 මාර්තු 31 වැනි දින රු. 1,000,000 පොදු සංචිතයට මාරු කිරීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් පිළියෙළ කල යුතු වන්නේ,**

(i) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(ii) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

(iii) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

පිළිවෙලින් 3: 2 අනුපාතයෙන් ලාභ අලාභ බෙදාගත් උකුළු මහතාගේ සහ මුකුළු මහතාගේ හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

උකුළු සහ මුකුළු හවුල් ව්‍යාපාරය

**2021 මාර්තු 31 වන දිනට**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | | රු. | රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | | 56,000 | |
| ගෘහභාණ්ඩ | | 8,000 | |
| ආයෝජන | | 20,000 | |
| වෙනත් ජංගම නොවන වත්කම්: ව්‍යාජ වත්කම් | | 15,000 | 99,000 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| බඩු තොගය | | 12,000 | |
| ණයගැතියෝ | 40,000 | | |
| අඩු කලා: බොල් ණය සඳහා ප්‍රතිපාදන | (2,000) | 38,000 | |
| බැංකුවේ මුදල් | | 23,000 | 73,000 |
| **මුළු වත්කම්** | | | **172,000** |
| | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය | | | |
| - උකුළු | | 20,000 | |
| - මුකුළු | | 16,000 | |
| සංචිත අරමුදල | | 10,000 | |
| **මුළු හිමිකම්** | | | 46,000 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පෙරේරා මහතාගේ ණය මුදල | | | 20,000 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු බිල්පත් | | 30,000 | |
| ණයහිමියෝ | | 76,000 | 106,000 |
| | | | |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | | **172,000** |

මෙම හවුල් ව්‍යාපාරය 2021 මාර්තු 31 දින විසුරුවා හරින ලදී. පහත සඳහන් අමතර තොරතුරු ද ඔබට සපයා ඇත.

1. උකුළු මහතා ආයෝජන භාරගත් අතර එයට එකඟ වූ වටිනාකම රු. 16,000 කි. එමෙන්ම උකුළු මහතා, පෙරේරා මහතාගේ ණය ගෙවීමටද එකඟ විය.
2. පහත වත්කම් සඳහා පහත සඳහන් ප්‍රමාණයන් උපලබ්ධි කර ගන්නා ලදී:
   - බඩු තොගය රු. 10,000
   - ණයගැතියෝ රු. 37,000
   - ගෘහභාණ්ඩ රු. 9,000
   - දේපල පිරියත හා උපකරණ රු. 50,000
3. ණයහිමියන් 2.5% ක වට්ටමකට යටත්ව සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කරනලද අතර ගෙවිය යුතු බිල්පත්ද සම්පූර්ණයෙන් ගෙවන ලදී.
4. රු. 2,200 ක වේතනයකට, මුකුළු මහතා විසින් වත්කම් මුදල් කිරීම සහ වගකීම් පියවා දැමීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට එකඟ විය.
5. සැබෑ උපලබ්ධි වියදම් රු. 2,000 ක්, හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

**2021 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරය විසිරුවා හැරීම සඳහා, ඔබ පහත සඳහන් ගිණුම් සකස් කල යුතුය.**

(i) උපලබ්ධි ගිණුම

(ii) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

(iii) බැංකු ගිණුම

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) කොරොෆ්ලෙක්ස් මෙඩිකැම්ප් සමාගම ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ නියැලෙන සමාගමක් වන අතර පසුගිය වර්ෂ දෙකක කාලය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත දැක්වේ.

කොරොෆ්ලෙක්ස් මෙඩිකැම්ප් සමාගම

**2020 මාර්තු 31 සහ 2021 මාර්තු 31 දිනට**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2021/2020 | 2020/2019 |
|---|---|---|
| | (රු.) | (රු.) |
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත සහ උපකරණ | 52,559,603 | 21,002,903 |
| | | |
| ජංගම වත්කම් | | |
| තොගය | 109,664,632 | 65,521,817 |
| වෙළඳ ණයගැතියන් | 15,533,370 | 12,051,050 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් | 2,288,000 | 2,978,259 |
| බැංකු මුදල් සහ අතැති මුදල් | 135,551 | 25,318 |
| | **127,621,553** | **80,576,444** |
| මුළු වත්කම් | **180,181,156** | **101,579,347** |
| | | |
| **හිමිකම් සහ වගකීම්** | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (1ක් රුපියල් 10 බැගින් වූ) | 15,000,000 | 15,000,000 |
| රඳවාගත් ඉපයුම් | 7,741,477 | 924,328 |
| | **22,741,477** | **15,924,328** |
| | | |
| ජංගම නොවන වගකීම් | | |
| දිගු කාලීන ණය | 88,888,478 | 44,281,229 |
| | **111,629,955** | **60,205,557** |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණය හිමියන් | 27,616,804 | 20,438,641 |
| වෙනත් ගෙවිය යුතු ශේෂ | 2,462,162 | 2,179,175 |
| බැංකු අයිරාව | 38,472,235 | 18,755,974 |
| මුළු හිමිකම් සහ වගකීම් | **180,181,156** | **101,579,347** |

කොරොප්ලෙක්ස් මෙඩිකැම්ස් සමාගම

2020 මාර්තු 31 සහ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | 2021/2020 | 2020/2019 |
|---|---|---|
| | (රු.) | (රු.) |
| විකුණුම් | 80,380,400 | 68,791,900 |
| | | |
| විකුණුම් පිරිවැය | (53,466,841) | ( 47,446,446) |
| | | |
| දළ ලාභය | **26,913,559** | **21,345,454** |
| | | |
| වෙනත් අදායම් | 1,334,559 | 1,088,789 |
| | | |
| | **28,248,118** | **22,434,243** |
| පරිපාලන වියදම් | ( 2,353,424) | (2,485,583) |
| කාර්ය මණ්ඩල පිරිවැය | (11,269,500) | (9,097,527) |
| විකුණුම් වියදම් | ( 900,192) | (416,157) |
| | | |
| **මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම් ලාභය** | **13,725,002** | **10,434,976** |
| මූල්‍ය පිරිවැය | (5,978,242) | (4,084,569) |
| බදු පෙර ශුද්ධ ලාභය / (අලාභය) | 7,746,760 | 6,350,407 |
| බදු | (929,611) | (762,049) |
| | | |
| **බදු පසු ශුද්ධ ලාභය / (අලාභය)** | **6,817,149** | **5,588,358** |

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය කොටසක වෙළඳපල මිල රු. 92 කි.

ඔබ විසින් 2021/2020 වර්ෂය සඳහා කොරොප්ලෙක්ස් මෙඩිකැම්ප් සමාගම සඳහා පහත අනුපාත ගණනය කිරීම අවශ්‍ය වේ.

(i) ලාභදායිත්ව අනුපාත තුනක් (03)

(ii) ද්‍රවශීලතා අනුපාත දෙකක් (02)

(iii) තෝලන අනුපාත තුනක් (03)

(iv) ආයෝජකයන්ගේ අනුපාත දෙකක් (02)

(ලකුණු 14)

ආ) පහත දැක්වෙන පද කෙටියෙන් හඳුන්වන්න.

(i) විලම්භිත අයභාර වියදම්

(ii) විචක්ෂණ සංකල්පය

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**